# අනගාරික ධර්මපාලතුමා ජාතික ව්‍යාපාරය තුළ සිංහල බෞද්ධ ජනයා අවදි කිරීමට ගෙන ගිය සන්නිවේදන උපක්‍රම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**චමෝදි කලුආරච්චි[1]**

*[1]ජනමාධ්‍ය අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රීපාලි මණ්ඩපය, ශ්‍රී ලංකාව.*

*[*]chamodi0111@gmail.com*

මෙරට ජාතික ව්‍යාපාරයේ ඉතිහාසය දෙස වඩාත් සුපරික්ෂාකාරීව බැලුවහොත් මෙරට ජාතික ව්‍යාපාරය මෙහෙය වූ නායකයන් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකර ඇත්තේ විදේශීය අධිපත්‍යයෙන් මිදී ස්වාධීන ජාතියක් බවට පත් වනවාට වඩා අධිරාජ්‍යවාදීන් මෙරට ගොඩනගන ලද හරසුන් සමාජ සිරිත්වලට එරෙහි වෙමින් සිංහල බෞද්ධ සිරිත් රැක ගැනීම කෙරෙහිය. එහි දී අනගාරික ධර්මපාලතුමා ද ජාතික ව්‍යාපාරය තුළ ජනතාව අවදිකිරීමට භාවිත කළ සන්නිවේදන උපක්‍රම යොදාගෙන ඇත්තේ ද බෞද්ධ ආගම හා මෙරට ආර්ය සිංහල සිරිත් රැක ගැනීම උදෙසාය. මෙහිදී මෙරට සිංහල බෞද්ධ ජනතාව අතර ගවමස් කෑම, මත්පැන් පානය මෙන්ම ඉංග්‍රීසි ඇඳුම් පැළඳුම් හා සිරිත් විරිත් අනුගමනය කිරීම වැනි සංස්කෘතිකාංග පැතිරීම වළකාලීම උදෙසා ප්‍රසිද්ධියේ විවේචන කරනු ලැබීය. මෙම විවේචන උදෙසා එකල පැවති ප්‍රධාන මාධ්‍ය වූ පුවත්පත් මාධ්‍ය භාවිත කරනු ලැබීය. අනගාරික ධර්මපාලතුමා ජාකික ව්‍යාපාරය තුළ ගෙන ගිය සන්නිවේදන උපක්‍රම භාවිත කරන ලද්දේ ඉංග්‍රීසින් විසින් මෙරට ව්‍යාප්ත කරන ලද හරසුන් සමාජ සිරිත් වලට එරෙහිව පමණක්ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වුණි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ මෙරට ජාතික ව්‍යාපාරය තුළින් සුචරිතවාදී සමාජයක් ගොඩනැන්වීම ධර්මපාලතුමා ගේ ප්‍රධාන අපේක්ෂාව වූ බව පෙන්වාදීමයි. ඒ අනුව ඉහත පර්යේෂණය සිදුකිරීම උදෙසා ක්‍රමවේදය ලෙස වාර්තා විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගත් අතර මේ සඳහා නියදිය ලෙස අනගාරික ධර්මපාලතුමා විසින් 'සිංහල බෞද්ධයා' පුවත්පතේ '1911' සහ '1912' අතර කාලයේ පළ කරන ලද ලිපි පරිශීලනය කරනු ලැබීය. ඒ අනුව ඉහත පර්යේෂණය මඟින් අවසානයේ පැහැදිලි වූයේ ධර්මපාලතුමන් ගෙන ගිය ජාතික ව්‍යාපාරයේ මුඛ්‍ය අරමුණ වූයේ බ්‍රිතාන්‍යය අධිරාජ්‍ය විසින් මෙරට ව්‍යාප්ත කරන ලද හරසුන් සමාජ සිරිත් සමාජයේ පැතිරීම වළකාලමින් සිංහල බෞද්ධ සමාජය හා සදාචාරය ආරක්ෂා කිරීම පමණක් බවයි.

මුඛ්‍ය පද ඃ ජාතිය, ජාතිකත්වය, සන්නිවේදනය, සංස්කෘතිය, සමාජය